# ටෙන්ඩර් දැන්වීම

# කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

## ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථාන ගබඩාවේ ඇති කුරුඳු නිෂ්පාදන අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මාතර, පලොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථාන ගබඩාවේ ඇති මතු දැක්වෙන කුරුඳු නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවනු ලැබේ.

මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ මෙම දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ටෙන්ඩර් ආකෘති පත්‍රයක් මඟින් පමණක් වේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 500.00 ක ගාස්තුවක් මෙම දෙපාර්තමේන්තුවේ කරන්දෙණිය ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ මාතර, පලොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානභාර නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ගෙවා ටෙන්ඩර් කොන්දේසි හා උපදෙස් ඇතුළත් ලියවිලි ලබා ගත හැකි අතර මිළ ගණන් ඉදිරිපත් කිරීමට පෙර සතියේ වැඩ කරන දිනවලදී අදාළ ද්‍රව්‍ය පරීක්ෂා කර බැලිය හැක.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා එහි වම් පස උඩ කෙළවර ,**"කුරුඳු නිෂ්පාදන සඳහා මිල ගණන්"**යනුවෙන් සඳහන් කර **<u>2026 ජූලි 10 දින ප.ව. 02.00</u>** ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.

මිළ ගණන් විවෘත කිරීම 2026 ජූලි 10 දින ප.ව. 02.15 ට සිදු කෙරේ.

| අනු අංකය | ද්‍රව්‍යය | ප්‍රමාණය |
|---|---|---|
| **01** | කුරුඳු කූරු: C5 ශ්‍රේණිය | 55.280 kg |
| **02** | කුරුඳු කූරු: H ශ්‍රේණිය | 132.150 kg |
| **03** | කුරුඳු පතුරු | 161.980 kg |
| **04** | කුරුඳු කුඩු | 20 kg |
| **05** | පැඟිරි තෙල් | 950 ml |
| **06** | කුරුඳු පොතු තෙල් | 825 ml |
| **07** | කුරුඳු කොළ තෙල් | 15 L 365 ml |

එල්. එම්. ජේ. කේ. ලින්දර

අධ්‍යක්ෂ ජනරාල්

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, කරන්දෙණිය